*සැ. යු.-* 2022.06.03 දින පළ වූ අංක 2283 *ගැසට් පත්‍රයේ* I : II (අ) සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,284 - 2022 ජූනි මස 10 වැනි සිකුරාදා - 2022.06.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපෑල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 474 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

සැ. යු. - (i) පළාත් පාලන ආයතන මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත 2022 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) අන්තරායකර සත්ත්ව (සංශෝධන) පනත් කෙටුම්පත 2022 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 ජූලි මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජූනි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

479- B 082353— 353 (2022/06)
D 1 -

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි.

මීගමුව දිසා අධිකරණයේ දී ය

<u>පැමිණිලිකරු</u>
*වර්ණකුලසූරිය සුරේෂ් ප්‍රිමාල් සෝවිස්,*
*අංක 52/1, කම්මල්තොට,*
*කොච්චිකඩේ.*

*එදිරිව*

<u>විත්තිකරු</u>
*අලහකෝන් මුදියන්සේලාගේ උපාලි ජුඩ් නවරත්න,*
*අංක 30/4, බණ්ඩාරවත්ත,*
*කොච්චිකඩේ.*

*නඩු අංකය : 3498 / උකස්*

ඉහත අංක දරන නඩුවේ තීන්දු ප්‍රකාශය මඟින් රුපියල් 2,509,000.00 ක මුදලක් සඳහාත්, එම මුදල ගෙවා නිමවන තෙක් පැමිණිල්ලේ දින සිට රුපියල් 1,650,000.00 ක මුදලක් වසරකට සියයට හැත්තෑ දෙක (72%) බැගින් පොලිය සහ ව්‍යවස්ථාපිත ගාස්තුවද සමග පැමිණිලිකරුට අයකරගැනීමට ආඥා කොට ඇති බැවින් ද,

විත්තිකරු විසින් තීන්දු ප්‍රකාශය කඩකරමින් පැමිණිලිකරු වෙත ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින්ද, විත්තිකරුට විරුද්ධව ඇස්කීසි නිකුත් කිරීමට ඉල්ලා ඇති බැවින් ද, 2022/02/03 දිනැති අධිකාරී පත්‍රය යටතේ පහත උපලේඛනයේ සඳහන් දේපළ විකිණීමට විධාන කර ඇති බැවින් ද,

මුදල විත්තිකරුගෙන් අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපල එකී ඉහත විස්තර කර ඇති දේපලට අයත් සියලුම අයිතිවාසිකම් පරවශ්‍යතා සහ අනුබද්ධිකයන් ද විත්තිකරුගෙන් කවර ආකාරයෙන් හෝ සියලුම අයිතිවාසිකම් හිමිකම් බලපුලුවන්කාරකම්, හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද මෙහි උපලේඛනයේ හා පැමිණිල්ලේ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපලෙන් උපදන සහ එකතු වන සියලු කුළී ලාභ සහ අනෙකුත් ආදායම් ද සියලු ගිවිසුම් සහ එකී රක්ෂණ ගිවිසුම් ද ඇතුලුව මෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති එකී දේපල නිශ්චිතවම බැඳී ඇති බව හා ඇස්කීසි කළ හැකි බව ප්‍රකාශ කරන ලද හෙයින් ද,

එකී මුදල අයකර ගැනීම සඳහා අධිකරණය විසින් අනුමත කරන ලද විකිණීමේ කොන්දේසිවලට යටත්ව පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපල,

**වර්ෂ 2022 ක් වූ ජූලි මස 12 වැනි දින ප.ව 1.00 ට** එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී වෙන්දේසියේ ඉහලම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් මුලු ගැණුම් මිලෙන් 25% ක මුදලක්ද, පිස්කල් ගාස්තුද, රජයට අයවිය යුතු ගාස්තු, තක්සේරු ගාස්තු, වෙන්දේසි ගාස්තු පුවත්පත් වල ප්‍රසිද්ධ කිරීමේ වියදම්ද, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වියදම් එවලේම මුදලින් මා වෙත ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් 75% ක් වූ ඉතිරි මුදල දින 30 ක් ඇතුලත මීගමුව දිසා අධිකරණයේ ඉහත කී අංක දරණ නඩුවට තැන්පත් කළ යුතු ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අයත් අලුත්කුරු කෝරළයේ දසිය පත්තුවේ මීගමුව මහ නගර සභා සීමාව තුල උතුරු පල්ලන්සේන පිහිටි පාසල් මාවතේ වරිපනම් අංක 40 දරණ කොටසින් කොටසක් වන 'බණ්ඩාරවත්ත' නැමැති ඉඩමෙන් එස්. එම්. දිසානායක බලයලත් මානක තැන විසින් 1996.10.09 වන දින මැන සාදන ලද අංක 4051 ඒ දරන පිඹුර ප්‍රකාර බෙදූ ලොට් අංක 04 දරණ කොටස වන උතුරට සහ නැගෙනහිරට : කතෝලික පල්ලියට අයිති කුඹුර ද, දකුණට : අඩි 12 ක් පළල පාර ද, බස්නාහිරට: ලොට් අංක 03 දරන කොටස ද, මායිම් වන පර්චස් එකොළහ (අ: 0- රූ: 0- පෑ: 11.0) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් වේ.

මෙය මීගමුව ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 1128/61 හි ලියාපදිංචි වී ඇත.

අධිකරණයේ අණ පරිදි,

රෙජිස්ට්‍රාර් තැන,
මීගමුව දිසා අධිකරණය.

වර්ෂ 2022 ක් වූ මැයි මස 24 වැනි දින දී ය.

06-119